# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2460/47 – 2025 නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා – 2025.11.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2025 අංක 109 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/18/2022/WS/202.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* 4/1/5/33.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් එම උපලේඛනයේ II වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශතාවයට යටත්වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත්කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩමේ විස්තරය.–** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 837 කුරුණෑගල නගරය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හකුරුකැටියාව (කොට්ඨාසය අංක 10 මඩමේගම, කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ) ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KU/KRN/2023/380 හා 2023.11.13 දිනැති මූලික ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

II. **පරවශතාවේ විස්තරය.–** විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ මලාපවහන නල මාර්ග එලීම සඳහා ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර A - හකුරුකැටියාව - ප්‍රමාණය:හෙක්. 0.0063**

උතුරට: යූ. ඩබ්ලිව්. එම්. එස්. සී. බී. උඩුකුඹුර හිමිකම් කියන ඉඩමේ නම සොයාගත නොහැකි වත්ත සහ ඩබ්ලිව්. එම්. පී. සඳුනි සෙනෙවිරත්න කිරින්ද හිමිකම් කියන හකුරුකැටියාව; නැගෙනහිරට: ඩබ්ලිව්. එම්. පී. සඳුනි සෙනෙවිරත්න කිරින්ද හිමිකම් කියන හකුරුකැටියාව සහ මාර්ගය (මහ නගර සභා); දකුණට: මාර්ගය (මහ නගර සභා) සහ ඩබ්ලිව්. එම්. පී. සඳුනි සෙනෙවිරත්න කිරින්ද හිමිකම් කියන හකුරුකැටියාව; බටහිරට: ඩබ්ලිව්. එම්. පී. සඳුනි සෙනෙවිරත්න කිරින්ද හිමිකම් කියන හකුරුකැටියාව; සහ මාර්ගය (මහ නගර සභා).

EOG 11 - 0009



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 110 දරන ආඥාව**

*මගේ යොමු අංකය*: 03J/92/FR/298.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඉ/2/34/8/2/93.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 පෙබරවාරි මස 26 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැඳුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලය
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, කලවාන.

II. **ඉඩමේ විස්තරය.–** සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපත්තුව සුළු කොට්ඨාසයේ, හපුගොඩ ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක ග.පි. 955 හා 1998.11.06 දිනැති මූලික පිඹුරේ පත්‍ර අංක 1, අතිරේක අංක 1 හි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 893 - කරඬහේන, යකිනිදොළහේන, පාළුඋනහේන - ප්‍රමාණය:හෙක්. 5.0312**

උතුරට: කැබලි අංක 748 හා 750; නැගෙනහිරට: කැබලි අංක 750, 751 හා 752; දකුණට: කැබලි අංක 751, 752 හා 754; බටහිරට: කැබලි අංක 748.

EOG 11 - 0010